**කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය කිරීම උදෙසා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය- 2015**

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය කිරීම උදෙසා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා සං ස) අතර 2010 නොවැම්බර් 08 දින එළඹි ණය අංක 4804 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 2 උපලේඛනයේ II හා 3 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සංවර්ධනය කිරීම උදෙසා පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම අනුව, වර්තමානයේ මුදල් අමාත්‍යාංශය එවකට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මූල්‍ය සංවර්ධන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ගෝලීය මූල්‍ය අර්බුදවලින් බලපෑමට ලක්වූ ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා කෙටිකාලීන මූල්‍යයන ඇතුළත් මූල්‍යයන සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීමයි.

### (අ) මූල්‍යයනය හා අවදානම බෙදා ගැනීම

(i) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට උප ණය සැපයීමේ අරමුණ සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන වලට (PFIs) ණය මාලාව ස්ථාපිත කිරීම මඟින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා ඵලදායී ආයෝජන සිදු කිරීම.

(ii) සහභාගීත්ව මූල්‍ය ආයතනවලට උප - ව්‍යාපෘති ණය සැපයීමේ අරමුණ සඳහා එම මූල්‍ය ආයතනවලට ණය මාලාවක් ස්ථාපිත කිරීම මඟින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා ප්‍රවේශය හා මූල්‍යයන කොන්දේසි ව්‍යාප්ත කිරීම. ඉන් සමහර උප - ව්‍යාපෘති ණය අවදානම බෙදා ගැනීමේ පහසුකම අරමුණ සහිතව ප්‍රතිග්‍රාහකයා විසින් සම්පූර්ණයෙන් ආවරණය කළ යුතුය.

### (ආ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල බැංකු කටයුතු ප්‍රතිපත්ති හා ධාරිතාවය ව්‍යාප්ත කිරීම

(i) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා මූල්‍යයන සැපයීම පිළිබඳ සහභාගීත්ව මූල්‍ය ආයතනවල සහ එම මූල්‍යයනයන් ඵලදායී උපයෝජනය පිළිබඳව එම ව්‍යවසායයන්ගේ ධාරිතාවය ගොඩනැගීම.

(ii) පරිපාලන හා මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදනය සහ වියපැහැදම් කිරීම ඇතුළත්ව ව්‍යාපෘති කළමනාකරණය, ක්‍රියාත්මක කිරීම සහ නියාමනය හා ඇගයීම සඳහා සහායයන් සැපයීම.

මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු. මිලියන 8,151.95 කට සමාන විගැහි මිලියන 37.8 (එජඩො මිලියන 57.4) ක මුළු වටිනාකම ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යයන කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මැයි 01 දින ආරම්භ කළ අතර 2014 මාර්තු 31 දිනට අවසන් කිරීමට නියමිත විය. පසුව, ව්‍යාපෘති කාලය 2015 සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත් 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි.ආචාර ධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පරීක්ෂා කිරීම්ද පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ආරම්භක හා අවසාන ශේෂ සහ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ලං.ම.බැ.) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(ඒ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ආරම්භක හා අවසාන ශේෂ සහ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිලිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ වටිනාකම | | 2015 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය සමාලෝචිත වර්ෂය තුළ | 2015 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|
| | **එජඩො මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **එජඩො මිලියන** | **රු. මිලියන** |
| ආසබැ | 57.4 | 8,151.95 | 2,400 | 1,837.25 | 44.73 | 6,351.88 |
| ශ්‍රී ලං ර | - | - | 10 | 8.13 | 0.30 | 42.52 |
| | **57.4** | **8,151.95** | **2,410** | **1,845.38** | **45.03** | **6,394.40** |

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු අනුව,රු. මිලියන 8,151.95 කට සමාන එජඩො මිලියන 57.4 ක මුළු ප්‍රතිපාදනය අතුරින් රු. මිලියන 6,351.88 කට සමාන එජඩො මිලියන 44.73 ක් පමණක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසාන වන විට උපයෝජනය කර තිබුණි.

(ආ) රු. මිලියන 6,654.47 ක ණය මාලාව සඳහා ප්‍රතිපාදන අතුරින්, මූල්‍ය ආයතන 08 ක් මඟින් උප ව්‍යාපෘති 824 ක් සඳහා රු.මිලියන 6,543.26 ක් ලබා දී තිබුණි. ඒ අනුව, ණය මාලාව සඳහා සිදු කළ ප්‍රතිපාදනයෙන් සියයට 98 ක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය අවසාන වන විට ලබා දී තිබුණි.